# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 12,105—1960 අප්‍රේල් 11 වැනි සඳුද—11.4.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

අ.ආ.කා. අංකය : O. 310/48.

ලංකාවෙහි චෙකොස්ලෝවැකියා අති විශේෂ හා පූර්ණ බල තානාපති ලෙස බලය පවරනු ලැබූ, ආචාර්ය ලැඩිස්ලාව් සිමෝව් උතුමාණන් වහන්සේගේ අක්ත පත්‍රය මහා රාජිණිය වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාර ගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1960 අප්‍රේල් 8 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලයේදී.

අ.ආ.කා. අංකය : O. 454/57.

ලංකාවෙහි යුගෝස්ලේවියානු අති විශේෂ හා පූර්ණ බල තානාපති ලෙස බලය පවරනු ලැබූ, ඇන්ට් රුකවිනා උතුමාණන් වහන්සේගේ අක්ත පත්‍රය මහා රාජිණිය වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාර ගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1960 අප්‍රේල් 8 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලයේදී.

---

## මිල පාලන දැන්වීම්

**1960 අංක 5 දරණ ආහාර මිළ නියෝගය** — **සහල් සහ වී**

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

#### නියෝගය

ගාල්ල දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක, කොළඹ මුහන්දිරම්ගේ සොලමන් ද සිල්වා වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4වැනි වගන්තියත් සමග කියැවෙන 3(2) වැනි වගන්තියෙන් සහකාර ආහාර මිළ පාලක තැනට පැවරී ඇති බලය අනුව—

1. 1959 දෙසැම්බර් මස 11 වැනි දින අංක 12,003 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත 1959 දෙසැම්බර් මස 8 වැනි දින සහ අංක 10 දරණ ආහාර මිළ නියෝගය 1960 අප්‍රේල් මස 11 වැනි දින සිට මෙයින් අවලංගු කරමි.

2. මෙයට යාකොට ඇති උප ලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ප්‍රදේශවල නීත්‍යානුකූල සලාකයේ මුල් කොටස සඳහා තොග වශයෙන් ශුද්ධ බරින් සහල් හොණ්ඩරයක් හෝ වී හොණ්ඩර දෙකක් මෙම අප්‍රේල් මස 11 වැනි දින සිට විකිණිය හැකි වැඩිම මිළ එම උප ලේඛනයේ දෙවැනි තීරයේද, සිල්ලර වශයෙන් ශුද්ධ බරින් සහල් රාත්තල් දෙකක් හෝ වී රාත්තල් හතරක් විකිණිය හැකි වැඩිම මිළ තෙවන තීරයේද අනු පිළිවෙලින් සඳහන්කර තිබෙන මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

3. එම උප ලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ප්‍රදේශවල නීත්‍යානුකූල සලාකයේ දෙවන කොටස සඳහා තොග වශයෙන් ශුද්ධ බරින් සහල් හොණ්ඩරයක් හෝ වී හොණ්ඩර දෙකක් විකිණිය හැකි වැඩිම මිළ හතරවන තීරයේද, සිල්ලර වශයෙන් ශුද්ධ බරින් සහල් රාත්තල් දෙකක් හෝ වී රාත්තල් හතරක් විකිණිය හැකි වැඩිම මිළ පස් වැනි තීරයේද, අනු පිළිවෙලින් සඳහන්කර තිබෙන මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

419—ජේ. ඇන්. ආර් 9198—4,350 (4/60)

4. තවද මෙම නියෝගයේ කාය්‍යීය සඳහා—

(අ) මොනම සහල් හෝ වී ප්‍රමාණයක් වුවත් යලිත් විකිණීමක් වුවහොත් ඒ තොග වශයෙන් විකිණීමක් බැව් ගණන් ගත යුතු බවත්,

(ආ) මොනම සහල් හෝ වී ප්‍රමාණයක් වුවත් පරිභෝගය සඳහා විකිණීමක් වුවහොත් එම විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් බව ගණන් ගත යුතු බවත්,

(ඇ) '' රාත්තල් '' හෙවත් '' රා '' යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්ඳුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවත්,

(ඈ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම සහල් හෝ වී ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ බවත් නියම කරමි.

5. එසේම මෙම නියෝගයේ සඳහන් සහල් හා වී විකිණිය හැකි වැඩිම මිළ ගණන් බල පවත්නා සෑම පෙදෙසකම වෙන ද්‍රව්‍යත් කලවම් කොට හෝ බාලකොට කිසිවෙක් සහල් හෝ වී නොවිකිණිය යුතු බවද නියම කරමි.

6. තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සහල් හෝ වී සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දකුම ඒ සහල් හෝ වී වලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා ඒ සහල් හෝ වී වල මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට අඩු නොවූ, ඉලක්කම් වලින්, මිළ පුවරුවක ලියා එම පුවරුව එම භාජනයට ඇදා එම සහල් හෝ වී ද මිළ පුවරුව ද ඕනෑම ගනු දෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ තැබිය යුතු බව මෙයින් නියෝග කරමි.

7. තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සහල් හෝ වී තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් විකිණීමක් කළේ නම් එසේ මිළ දී ගන්නා තැනැත්තා ඉල්ලා සිටිය හොත් පහත සඳහන් විස්තර ඇතුළත් කුවිතාන්සියක් දිය යුතු බවද නියෝග කරමි :—

(අ) විකුණූ දිනය ;

(ආ) සහල් හෝ වී විකුණූ ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන්ද නැතහොත් සිල්ලර වශයෙන්ද යන වග.

8. සහල් හෝ වී විකිණීමේදී යම්කිසි දෙයක බහාලනු ලැබුවේ නම් හෝ ඔතනු ලැබුවේ නම් එහි මිළත් මේ නියෝගයෙන් නියමිත මිළ ගණන් වලට ඇතුළත් බව මෙයින් නියම කරමි.

9. තවද මෙම නියෝගයෙන් සේරු 80 වේ නැතහොත් රාත්තල් 160 ටේ ගෝනි වශයෙන් විකිණීම කරනු ලබන වෙළෙන්දන් විසින් විකිණිය හැකි මිළ සලකනු ලබන්නේ දල බරෙන් රාත්තල් 2¼ ක් අඩුවෙන් බව නියම කරමි.

10. තවද මෙම නියෝගයෙන් සේරු 112 හේ නැතහොත් රාත්තල් 224 රේ ගෝනි වශයෙන් විකිණීම කරනු ලබන වෙළෙන්දන් විසින් විකිණිය හැකි මිළ සළකනු ලබන්නේ දළ බරෙන් රාත්තල් තුනක් අඩුවෙන් බව නියම කරමි.

11. තවද මෙම නියෝගයේ කාය්‍යීය සඳහා '' ශුද්ධ බර '' යනුවෙන් හැඳින්වෙන්නේ දළ බරෙන් තාර බර අඩුකළායින් පසු ඉතිරි බර බවත්ය.

සී. එම්. එස්. ද සිල්වා,
ගාල්ලු දිස්ත්‍රික්කයේ ආහාර මිළ පාලක.

1960 අප්‍රේල් මස 9 වැනි දින පෙරවරු 11 ට
ගාල්ලේ කච්චේරියේදී අත්සන් තබන ලදී.

## උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>නීත්‍යානුකූල සලාකයේ පළමුවැනි සහල් රා. 2 හෝ වී රා. 4 සඳහා තොග වශයෙන් ශුද්ධ බර සහල් හොණ්ඩරයක් හෝ වී හොණ්ඩර 2ක් විකිණිය හැකි වැඩිම මිළ | 3 වැනි තීරය<br>නීත්‍යානුකූල සලාකයේ පළමුවැනි සහල් රා. 2 හෝ වී රා. 4 සඳහා සිල්ලර වශයෙන් ශුද්ධ බර අනුව විකිණිය හැකි වැඩිම මිළ | 4 වැනි තීරය<br>නීත්‍යානුකූල සලාකයේ දෙවැනි සහල් රා. 2 හෝ වී රා. 4 සඳහා තොග වශයෙන් ශුද්ධ බර සහල් හොණ්ඩරයක් හෝ වී හොණ්ඩර 2ක් විකිණිය හැකි වැඩිම මිළ | 5 වැනි තීරය<br>නීත්‍යානුකූල සලාකයේ දෙවැනි සහල් රා. 2 හෝ වී රා. 4 සඳහා සිල්ලර වශයෙන් ශුද්ධ බර අනුව විකිණිය හැකි වැඩිම මිළ |
|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| ගාළු නාගරික සීමාව සහ කඩවත් සතර ... | 13 90 | 0 25½ | 13 90 | 0 25½ |
| **ගඟබඩ පත්තුව :** | | | | |
| බද්දෙගම ග.කා.ස. සීමාව ... | | | | |
| නාගොඩ එම ... | 14 13 | 0 26½ | 14 13 | 0 26½ |
| තල්ගස්වල ගම්මුලාදැනි කොට්ඨාශය හැර | | | | |
| තල්ගස්වල ග.මු. කොට්ඨාශය ... | 14 80 | 0 27 | 14 80 | 0 27 |
| උඩුගම ගම්මුලාදැනි කොට්ඨාශය ... | — | 0 27 | — | 0 27 |
| වඳුරඹ ග.කා.ස. සීමාව ... | — | 0 27 | — | 0 27 |
| පොල්ගහවිල ගම්මුලාදැනි කොට්ඨාශය ... | — | 0 27 | — | 0 27 |
| තෙලිකඩ-මාපුවාන ග.කා.ස. සීමාව ... | — | 0 26½ | — | 0 26½ |
| **බටහිර බෙන්තර වලල්ලාවිටි කෝරළය :** | | | | |
| බෙන්තොට ග.කා.ස. සීමාව ... | 13 89 | 0 26 | 13 89 | 0 26 |
| කොස්ගොඩ ග.කා.ස. සීමාව ... | | | | |
| **නැඟෙනහිර බෙන්තර වලල්ලාවිටි කෝරළය :** | | | | |
| අම්බන විදන ආරච්චි තැනගේ කොට්ඨාශය | — | 0 26½ | — | 0 26½ |
| වැයිහේන ග.කා.ස. සීමාව—නියාගම | | | | |
| මත්තක සහ පිටිගල ග.මු. කොට්ඨාශ හැර | 14 66 | 0 26 | 14 66 | 0 26 |
| නියාගම ගම්මුලාදැනි කොට්ඨාශය ... | — | 0 27 | — | 0 27 |
| මත්තක එම ... | — | 0 26½ | — | 0 26½ |
| පිටිගල එම ... | 14 52 | 0 26½ | 14 52 | 0 26½ |
| ඇල්පිටිය ග.කා.ස. සීමාව—ඕමත්ත ... | | | | |
| ගම්මුලාදැනි කොට්ඨාශය හැර ... | 14 30 | 0 26 | 14 30 | 0 26 |
| ඕමත්ත ගම්මුලාදැනි කොට්ඨාශය ... | — | 0 26½ | — | 0 26½ |

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>නීත්‍යානුකූල සලාකයේ පළමුවැනි සහල් රා. 2 හෝ වී රා. 4 සඳහා තොග වශයෙන් ශුද්ධ බර සහල් හොණ්ඩරයක් හෝ වී හොණ්ඩර 2ක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>නීත්‍යානුකූල සලාකයේ පළමුවැනි සහල් රා. 2 හෝ වී රා. 4 සඳහා සිල්ලර වශයෙන් ශුද්ධ බර අනුව විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 4 වැනි තීරය<br>නීත්‍යානුකූල සලාකයේ දෙවැනි සහල් රා. 2 හෝ වී රා. 4 සඳහා තොග වශයෙන් ශුද්ධ බර සහල් හොණ්ඩරයක් හෝ වී හොණ්ඩර 2ක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 5 වැනි තීරය<br>නීත්‍යානුකූල සලාකයේ දෙවැනි සහල් රා. 2 හෝ වී රා. 4 සඳහා සිල්ලර වශයෙන් ශුද්ධ බර අනුව විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|---|
| **වැල්ලබඩ පත්තුව :** | | | | |
| රත්ගම ක.කා.ස. සීමාව ... | | | | |
| හික්කඩුව ග.කා.ස. සීමාව ... | | | | |
| වේරගොඩ ග.කා.ස. සීමාව ... | | | | |
| බටපොල ග.කා.ස. සීමාව ... | — ... | 0 26 ... | — ... | 0 26 |
| මාදම්පෙ ග. කා. ස. සීමාව ... | | | | |
| කරන්දෙනිය ග.කා.ස. සීමාව ... | | | | |
| කුරුඳුගහහැතැප්ම ග.මු. කොට්ඨාශය | | | | |
| බලපිටිය සුළු නගර සභා සීමාව ... ... | 14 16 ... | 0 26 ... | 14 16 ... | 0 26 |
| වතුගෙදර එම ... ... | 14 02 ... | 0 26 ... | 14 02 ... | 0 26 |
| අම්බලන්ගොඩ එම ... ... | 13 82 ... | 0 25½ ... | 13 82 ... | 0 25½ |
| හික්කඩුව එම ... ... | 13 89 ... | 0 25½ ... | 13 89 ... | 0 25½ |
| දෙඩන්දූව එම ... ... | 13 89 ... | 0 25½ ... | 13 89 ... | 0 25½ |
| **තල්පෙ පත්තුව :** | | | | |
| අහන්ගම ග.කා.ස. සීමාව ... | 13 96 ... | 0 26 ... | 13 96 ... | 0 26 |
| හබරාදූව ග.කා.ස. සීමාව ... | | | | |
| කෝදගොඩ ග.කා.ස. සීමාව ... ... | 14 20 ... | 0 26 ... | 14 20 ... | 0 26 |
| කොට්ටව ග.කා.ස. සීමාව ... ... | 14 64 ... | 0 27 ... | 14 64 ... | 0 27 |
| **හිනිදුම් පත්තුව :** | | | | |
| හිනිදුම ග.කා.ස. සීමාව—මාවනාන ගම්මුලාදැනි කොට්ඨාශය හැර ... | 14 64 ... | 0 27½ ... | 14 64 ... | 0 27½ |
| මාවනාන ගම්මුලාදැනි කොට්ඨාශය ... | | | | |
| නෙළුව ග.කා.ස. සීමාව ... | — ... | 0 28½ ... | — ... | 0 28½ |
| ඕපාත ග.කා.ස. සීමාව ... | | | | |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියම මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉහළම මිළ ගණන් ය. මේ මිළ ගණන් වලට ඉහළින් ද්‍රව්‍යයන් විකිණිය නොහැක. යුනියන් ගබඩාවල අය කරන කිරුම් ගාස්තු ආදිය ඉහත සඳහන් තොග වෙළඳ ගණන්වලට ඇතුළත් වේ.

---

**අංක පී. ඇල් 5/60 දරණ ආහාර මිල නියෝගය** **සහල් (තොග සහ සිල්ලර).**

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් චාර්ලිස් අබේදීර වන මම, 1950 අංක 29 දරණ මිල පාලන පනතෙහි 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව :—

(1) 1959 දෙසැම්බර් මස 12 වැනි දින අංක 12,015 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරණ ලද අංක පී. එල්. 15/59 සහ 1959 දෙසැම්බර් 14 වැනි දින දරණ ආහාර මිළ නියෝගය 1959 අප්‍රෙල් 11 වැනි දින සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උප ලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් පෙදෙස්වල වෙළඳාම කරගෙන යන ආහාර පාලනය සඳහා පත් කරණු ලැබූ බලයලත් වෙළඳුන්ට නියමිත සහල් ප්‍රමාණය සඳහා බෙදහරින සහල් තොග වශයෙන් ශුද්ධ කිරුමෙන් හොණ්ඩරයක් විකිණීමේ වැඩිම මිළ 1960 අප්‍රේල් මස 11 වැනි දින සිට එම උපලේඛනයේ 2 වැනි තීරයේ පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මීට යාකර ඇති උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් පෙදෙස්වල නියමිත සහල් ප්‍රමාණය සඳහා බෙද හරින සහල් වලින් සිල්ලර වශයෙන් ශුද්ධ කිරුමෙන් රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ 1960 අප්‍රේල් මස 11 වැනි දින සිට එම උප ලේඛනයේ 3 වැනි තීරයේ පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(4) 1959 දෙසැම්බර් 12 වැනි දින අංක 12,015 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරණ ලද සහල් සම්බන්ධ අංක පීඑල් 15/59 හා 1959 දෙසැම්බර් 14 වැනි දින දරණ ආහාර මිළ නියෝගයේ (4) සිට (8) දක්වා ඡෙදයන් මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1960 අප්‍රෙල් මස 8 වැනි දින පෙරවරු 10 ට පොළොන්නරුවේ කච්චේරියේ දී අත්සන් තබන ලදී.

සී. අබේදීර,
සහකාර මිළ (ආහාර) පාලක තැන, පොළොන්නරුව දිස්ත්‍රික්කය.

### උප ලේඛනය

| 1 වැනි තීරය<br>කොට්ඨාශය | 2 වැනි තීරය<br>නියමිත සහල් ප්‍රමාණය සඳහා බෙදහරින සහල් වල ශුද්ධ කිරුමෙන් හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>නියමිත සහල් ප්‍රමාණය සඳහා බෙදහරින සහල්වල ශුද්ධ කිරුමෙන් රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| සිංහල පත්තුව ... ... | 14 43 ½ ... | 0 14 |
| මැද පත්තුව ... ... | 14 58 ½ ... | 0 4 |
| එගොඩ පත්තුව ... ... | 14 75 ½ ... | 0 15 |

සැළකිය යුතුයි.—[illegible]ල ගණන් සහල් විකිණිය යුතු නියමිත මිළ නොවේ. ඒ මිළ ගණන් සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන් ය. එයට වඩා වැඩි මිළට සහල් විකිණිය [illegible] හැකි ය.

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.